කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
கைத்தொழில் மற்றும் வணிக அமைச்சு
Ministry Of Industry and Commerce

# 2016

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றல் அறிக்கை
# PERFORMANCE REPORT

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
Department of Cooperative Development

# කාර්ය සාධන වාර්තාව
# 2016

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

# පෙරවදන

සමුපකාර ආචාර ධර්ම හා සාරධර්ම මත පිහිටා සමුපකාර ව්‍යාපාරයටම අනන්‍ය වූ ප්‍රතිපත්ති මාලාවක් අනුව ක්‍රියා කරනු ලබන සමුපකාර සංවිධාන මෙරට ජන ජීවිතය හා අවියෝජනීය ලෙස බැඳී පවතී. මෙරට සමුපකාර ව්‍යාපාරය තරඟකාරී ආර්ථික පරිසරය තුළ තම සාමාජික , ආර්ථික, සංස්කෘතික අවශ්‍යතා තෘප්ත කරලීමේ අභියෝගය ජය ගනිමින් රජය හා එක්ව පොදු ජනතාවගේ සුභසිද්ධිය සඳහා ද දායකත්වය සපයනු ලබයි. වර්තමානය වන විට ලොව පුරා "තිරසාර සංවර්ධනය" යන සංකල්පය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු වී ඇත. සමුපකාර ව්‍යාපාරය හා බැඳී පවතින සමාජ හිතකාමී ආචාර ධර්ම , සාරධර්ම හා ප්‍රතිපත්ති පිළිබඳ සලකා බැලීමේදී තිරසාර සංවර්ධනය යන සංකල්පය ක්‍රියාවට නැංවීම සඳහා "සමුපකාර ආර්ථිකයක්" වඩා සුදුසු බව බොහෝ දෙනාගේ පිළිගැනීම වී ඇත. ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය දැක්ම කර ගත් මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර සංවිධාන හා සමුපකාර ප්‍රජාව සමඟ එක්ව ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට පුළුල් ලෙස මැදිහත් වී ක්‍රියා කරනු ලබයි.

මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පළාත් සමුපකාර දෙපාර්තමේන්තුන්හි විෂය පථය ඉක්ම වූ තෘතීයික මට්ටමේ සමුපකාර සංවිධාන හා දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති සඳහා මඟ පෙන්වීම , අධීක්ෂණය හා විගණන කටයුතු සිදු කරනු ලබන අතර පළාත් සීමාව ඉක්ම වූ සමුපකාර සමිති ලියාපදිංචිය ද සිදු කරයි. එමෙන්ම මෙරට සමුපකාර ව්‍යාපාරයේ නියමුවා ලෙස කටයුතු කරනු ලබන මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් සමුපකාර දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය වෙමින් වාර්ෂික සංඛ්‍යාන වාර්තාව නිකුත් කිරීම, ග්‍රාමීය බැංකු නියාමනය කිරීම, ජාතික වැදගත්කමකින් යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සමුපකාර ව්‍යාපාරයේ සංවර්ධනය වෙනුවෙන් සිදු කරන මෙහෙවරයන්ගෙන් කිහිපයකි.

2016 වර්ෂය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම කාර්ය සාධන වාර්තාව මඟින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යභාරය හා ඒ සඳහා භාවිතා කළ සම්පත් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර තෘතීයික මට්ටමේ සමුපකාර සංවිධාන හා දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සංවිධාන පිළිබඳ මූලික තොරතුරු ද ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ මෙන්ම ලෝක ප්‍රජාවගේ තිරසාර සංවර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා ශක්තිය, ධෛර්ය හා අවකාශයන් සියළුම සමුපකාරිකයන්ට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එස්.එල් නසීර්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

## දැක්ම

ජනතා ව්‍යාවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා
සානුබල සපයමින්
සමුපකාර සමිති වල යහ පාලනය
ගොඩනැඟීම සඳහා
පුළුල් ලෙස මැදිහත්වීම

# පටුන


01. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය

- 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්
- 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
- 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
  - 1.3.1 කාර්යමණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
  - 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්
  - 1.3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්
  - 1.3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්
  - 1.3.5 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

- 1.4.1 දේශීය පුහුණු
- 1.4.2 විදේශීය පුහුණු
- 1.4.3 මහජන බැංකු ආධාර මඟින් සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන්

02. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්

- 2.1 2016 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම.
- 2.2 සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම
- 2.3 සමුපකාර සමිති/ සංගම් නිලවරණ පැවැත්වීම
- 2.4 අක්‍රීය සමිති ඈවර කිරීම
- 2.5 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
- 2.6 නීති කටයුතු
  - 2.6.1 ආරවුල් බේරුම්කරණය
  - 2.6.2 උසාවි බලගැන්වීම
  - 2.6.3 වර්ෂය තුළ අවසන් වූ නඩු
- 2.7 අරමුදල් කළමනාකරණය
  - 2.7.1 සමුපකාර අරමුදල
  - 2.7.2 සමුපකාර අතිරික්ත අරමුදල
- 2.8 2016 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
- 2.9 ග්‍රාමීය බැංකු නියාමනය
- 2.10 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- 2.11 සැලසුම් කටයුතු
- 2.12 මාධ්‍ය කටයුතු

3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

- 3.1 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්
- 3.2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති
  - 3.2.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
  - 3.2.2 දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

# 1 පරිච්ඡේදය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකේය දිළිඳු ජනතාවට සමව උපකාර කරමින් ජනතා ව්‍යවසායක් ලෙස ගොඩනැගුනු සමුපකාර ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනය අරමුණු කර ගනිමින් 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. එය 1945 වසරේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙසින් නම් කරන ලද අතර, වර්තමානයේදී කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරන ස්ථානයේ පිහිටා ඇති අතර වර්තමානයේදී ලාංකේය ජනතාව වෙනුවෙන් පුළුල් මෙහෙවරක් ඉටු කරමින් තම සේවාවන් පවත්වාගෙන යනු ලබයි.

### 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ❖ අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම.
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදු කිරීම
- ❖ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම
- ❖ ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහායවීම
- ❖ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම

**සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු**

- ❖ සමිති ලියාපදිංචි කිරීම
- ❖ සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- ❖ සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- ❖ අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- ❖ නිළවරණ කටයුතු අධීක්ෂණය
- ❖ මහ සභා කැඳවීම / කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- ❖ තීරකකරණ කටයුතු සහ උසාවි බල ගැන්වීම්
- ❖ සමුපකාර සමිති / සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

**කළමනාකරණ කටයුතු**

- ❖ පාලක මණ්ඩල පත් කිරීම / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම
- ❖ ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- ❖ විගණනය
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය / විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයට සහායවීම.
- ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය.
- සමුපකාර සමිති වලට අදාළ සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය.
- අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- සමුපකාර සමිති / සංගම් අතර සම්බන්ධීකරණය.

## සංවර්ධන කටයුතු

- වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.
- සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම
- සමුපකාර සමිති හා සංගම් වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම
- සමුපකාර සමිති හා සංගම් වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය
- සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම
- සංවර්ධන ආධාර හා සානුබල සැපයීම
- සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය
- සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය
- සේවක / නිලධාරී සුභසාධනය

## අරමුදල් පාලනය

- දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය
- ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන් කරනු ලබන දායක මුදල් අය කර ගැනීම
- සමුපකාර සමිති වල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබාදීම
- ණය ආපසු අය කර ගැනීම
- ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීම

## අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- සාමාන්‍ය පරිපාලනය
- මානව සම්පත් කළමනාකරණය
- කාර්ය සාධනය වර්ධනය
- වත්කම් කළමනාකරණය

## 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2016 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 09 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්,

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය
7. බැංකු නියාමන අංශය
8. ව්‍යාපෘති අංශය
9. සැලසුම් අංශය

# සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

අප දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි මෙම වසර තුළ සිදු වූ සුවිශේෂී වූ සිදුවීම් කිහිපයකි.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය  කොමසාරිස් (වැ.බ) තනතුරෙහි සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එච්. සුරම්‍යා ෆොන්සේකා මිය ස්ථානමාරු වී යාමෙන් අනතුරුව 2016.07.26 දින සිට නියෝජ්‍ය කොමසාරිස් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ එන්.ඩබ්ලිව් ඩයස් මිය පත්වීම මෙම වසර තුළ සිදු විය. එහෙත් එතුමිය මෙම වසර තුළදීම නැවත ස්ථාන මාරු වී යාම හේතුවෙන් නියෝජ්‍ය  කොමසාරිස් තනතුරෙහි පුරප්පාඩුවක් ඇති විය.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ වසර ගණනාවක් සේවය කළ ගණකාධිකාරී බී. කේ. එම්. පේ රුදුගෝ  මිය ස්ථාන මාරු වී ගිය අතර ඊ. එම්. එන්. ආර් බණ්ඩාර මහතා 2016.12.08 වන දින සිට ස්ථාන මාරු ලබා පැමිණ ගණකාධිකාරී ලෙසින් සේවයට එක් විය. පසු ගිය වසර තුල පුරප්පාඩුව පැවති පරිපාලන නිලධාරි තනතුර සම්පූර්ණ කරමින් ලලිතා බස්නායක මිය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සේවයට එක්වීම මෙම වසර තුළ සිදු වූ තවත් සුවිශේෂී සිදුවීමකි.

තවද රාජ්‍ය කළමණාකරණ සහකාර III වන ශ්‍රේණිය සඳහා නව පත්වීම් ලබා පැමිණි නිළධාරීන් කිහිප දෙනෙක්ද අප සමඟ සේවයට එක් විය. එසේම රාජ්‍ය කළමණාකරණ සහකාර ,රියදුරු හා කාර්යාල කාර්ය සහායක තනතුරු වල සේවය කළ පිරිස ද ස්ථාන මාරු වී යාමත් ස්ථාන මාරු ලැබ පැමිණීමත් මෙම වසර තුළ විටින් විට සිදු විය.

### 1.3.1 කාර්යමණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2016.12.31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2016. 12.31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ මට්ටම | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 (වැ.බ) | 00 |
| 02 | | නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II/III) | 04 | 01 | 03 |
| 03 | | ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II/III) | 01 | 01 | 00 |
| 04 | | නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 01 | 02 |
| | | **එකතුව** | **09** | **04** | **05** |
| 05 | තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| 06 | | සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය | 05 | 05 | 00 |
| 07 | | භාෂා පරිවර්තක | 01 | - | 01 |
| | | **එකතුව** | **07** | **06** | **01** |
| 08 | ද්විතීය මට්ටම | සමුපකාර සංවර්ධන නිලධාරී I සහ II ශ්‍රේණි | 62 | 02 (46) | 16 |
| 09 | | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | | 24 | |
| 10 | | සමුපකාර සංවර්ධන නිලධාරී | | 20 | |
| 11 | | සංවර්ධන නිලධාරී | 15 | 09 | 06 |
| 12 | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 23 | 05 |
| | | **එකතුව** | **105** | **78** | **27** |
| 13 | ප්‍රාථමික මට්ටම | රියදුරු | 05 | 05 | 00 |
| 14 | | කාර්යාල කාර්ය සහායක | 15 | 07 | 08 |
| **එකතුව** | | | **20** | **12** | **08** |
| **මුළු එකතුව** | | | **141** | **100** | **41** |

### 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | එස්.ඒ. මීමනගේ මයා | රා.ක.ස III | 2016.03.01 |
| 02 | ඊ.එම්. බටගම මිය | රා.ක.ස III | 2016.03.01 |
| 03 | ආර්.ඒ.ආර්.ආර්.කුමාර මයා | රා.ක.ස III | 2016.03.01 |
| 04 | කේ.ජී.එස් උපමාලිකා මිය | රා.ක.ස III | 2016.03.01 |
| 05 | ඩී.එම්.ඒ.එල්.දිසානායක මෙය | රා.ක.ස III | 2016.07.04 |
| 06 | ආර්.ඒ.පී.හංසනී මෙය | රා.ක.ස III | 2016.07.04 |

### 1.3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | එන්.ඩබ්ලිව්. ඩයස් මිය | නියෝජ්‍ය කොමසාරිස් | 2016.07.26 |
| 2 | ඊ.එම්.එන්.ආර්. බණ්ඩාර මයා | ගණකාධිකාරී | 2016.12.08 |
| 3 | ලලිතා බස්නායක මිය | පරිපාලන නිලධාරී | 2016.09.05 |
| 4 | ඒ.ඒ. පුෂ්පා රංජනී මිය | රා.ක.ස I | 2016.08.01 |
| 5 | කේ.එච්.පී.එච්. කැකුණාවෙල මිය | රා.ක.ස II | 2016.03.01 |
| 6 | ජේ.ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ජයවර්ධන මෙය | රා.ක.ස II | 2016.07.01 |
| 7 | ආර්.එම්. ජයසිරි මයා | රියදුරු I | 2016.01.27 |
| 8 | මහසෙන් කැටිපෙආරච්චි මයා | රියදුරු I | 2016.06.08 |
| 9 | එන්.මුණසිංහ මෙය | කා.කා.ස III | 2016.03.09 |
| 10 | එච්.ආර්.ජේ.එස්. සූරියබණ්ඩාර මයා | කා.කා.ස III | 2016.01.01 |
| 11 | එච්.ඒ රෂිනි දිල්හාරා මිය | කා.කා.ස III | 2016.07.07 |

### 1.3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | කේ.ඒ.ඩී.ආරියදාස මයා | කා.කා.ස | 2016.02.10 |

### 1.3.5 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01 | එච්. සුරම්‍යා ෆොන්සේකා මිය | නියෝජ්‍ය කොමසාරිස් (වැ.බ) | 2016.01.01 |
| 02 | එන්.ඩබ්ලිව්.ඩයස් මිය | නියෝජ්‍ය කොමසාරිස් | 2016.12.07 |
| 03 | බී.කේ.එම්.ජේ.රුද්‍රිගු මිය | ගණකාධිකාරී | 2016.06.01 |
| 04 | එස්.එච්.ටී.තමාලිකා මෙය | ස.සං.නි III | 2016.11.02 |
| 05 | කේ.ටී.එම්.එම්.තෙන්නකෝන් මිය | රා.ක.ස I | 2016.05.02 |
| 06 | එල්.ජී.යූ.නිශාන්ත මයා | රා.ක.ස II | 2016.03.01 |
| 07 | ජේ.ඩබ්ලිව්.ඒ.ඩී.එස්.ජයවර්ධන මෙය | රා.ක.ස II | 2016.07.27 |
| 08 | ආර්.එල්.එම්.මල්කාන්ති මිය | රා.ක.ස III | 2016.03.01 |
| 09 | ජී.එම්.එම්.ගරුසිංහ මිය | රා.ක.ස III | 2016.03.14 |
| 10 | කේ.එච්.ජී.කේ.කුමාර මයා | රා.ක.ස III | 2016.03.10 |
| 11 | ආර්.පී.ඩී.එස්.රාජපක්ෂ මයා | රියදුරු I | 2016.01.13 |
| 12 | එල්.ඩී.නන්දසේන මයා | රියදුරු II | 2016.01.14 |
| 13 | එන්.ඩබ්ලිව්.ආර්.රත්නසිරි මයා | කා.කා.ස II | 2016.03.09 |
| 14 | එම්.එම්.එම්.සූරියබණ්ඩාර මයා | කා.කා.ස III | 2016.07.04 |

## 1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 1.4.1 දේශීය පුහුණු

2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගී කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 01 | විනය කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2016.03.28 - 2016.03.30 | ඒ.ඒ.ඒ.එන්.අතාවුද මයා |
| 02 | රජයේ නිලධාරීන් දැනුවත් විය යුතු නීතිය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2016.03.28<br>2016.03.29 | කේ.එල්.එස්.මල්කාන්ති මිය |
| 03 | **Attitudes and skill development** | කොළඹ විශ්ව විද්‍යාලය | 2016.04.29 | ඒ.ඒ.ඒ.එන්.අතාවුද මයා.<br>එස්.ඒ තලංගම මයා |
| 04 | ව්‍යාපෘති කළමණාකරණය පිලිබඳ පුහුණු පාඨමාලාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තිඹිරිගස්යාය | 2016.06.14<br>2016.06.15 | එච්.එම්.ඒ සඳමාලි මිය<br>කේ.ආර්.ටී සෝමරත්න මිය<br>ඒ.ඒ.ඒ.එන්.අතාවුද මයා<br>එස්.එච්.ටී.තමාලිකා මෙය<br>ඩී.ඒ.එස්.සේනාධීර මයා |
| 05 | Attitudes and skill development | කොළඹ විශ්ව විද්‍යාලය | 2016.06.24 | කේ.එල්.එස්.මල්කාන්ති මිය<br>එච්. එම්. පී. එම්. රූපරත්න මෙය |
| 06 | අලාභ වාර්තා කිරීම හානි පූර්ණය කපා හැරීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2016.07.28<br>2016.07.29 | පී.එම්.ඒ.එල් දිසානායක මෙය |
| 07 | කළමණාකරණ සහායකයින්ගේ සංවර්ධනය කිරීමේ පුහුණු වැඩමුළුව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 2016.08.25 (බ්‍රහස්පතින්දා දින 05 ) | කේ.එච්.පී.එච් කැකුණවෙල මිය |
| 08 | **Efficiency Bar Examination Training Program** | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2016.08.05<br>2016.08.06 | ආර්.එම්.පී.එස් රත්නායක මයා<br>ආර්.ඒ.පි.හංසනි මෙය |
| 09 | රජයේ මූල්‍ය කළමණාකරණය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2016.08.18<br>2016.08.19 | ටී.එන්.කේ.සේනාරත්න මිය<br>එන්.එස්.විජේසිංහ මයා<br>එෆ්.බී.අයි.යූ දිල්රුක්ෂි මෙය<br>යූ.එල්.එන්.දනංජලි මෙය<br>ඒ.එස්.ජී.සංජීවනී මිය |
| 10 | **Government Payroll System** | මිලෝදා ආයතනය | 2016.12.05-<br>2016.12.07 | එන්.ඒ.එච් පීරිස් මෙය<br>කේ.එම්. මිනෝලි මෙය |
| 11 | Government Accounting System | මිලෝදා ආයතනය | 2016.12.20 -<br>2016.12.22 | කේ.එච්.පී.එච් කැකුණවෙල මිය<br>එල්.එච්.එම්.බී ලංසකාර මිය |

## 1.4.2 **විදේශීය පුහුණු**

2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන , පුහුණු , ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී ඇත.

| | වැඩසටහන | කාල පරිච්ඡේදය | පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 01 | International programme on Financal/Inclusion | 2016.01.07- 2016.01.09 | ඉන්දියාව | ආර්.මුරලිදරන් මයා (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 02 | International programme on training techniques for trainers of co-operative and rural financing institution | 2016.01.18 - 2016.01.22 | ඉන්දියාව | ඩී.ඒ.එස් සේනාධීර මයා (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 03 | Strengthen Low Income Families through women in Rural area | 2016.06.02- 2016.06.18 | කොරියාව | පී.අයි කුරේරා මිය (දිස්ත්‍රික් නිලධාරි වැ.බ) |
| 04 | Workshop and general assembly of NEDAC | 2016.07.11 - 2016.07.15 | නේපාලය | ඩී ජීවනාදන් මයා (සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්) |
| 05 | Restructuring and strengthening agricultural rural financing Institutions | 2016.07.04- 2016.07.08 | ඉන්දියාව | ඩී.ඒ.එස් බුලත්සිංහල මයා (සමුපකාර සංවර්ධන නිලධාරී) |
| 06 | Database Management for cooperatives and rural financing institutions | 2016.07.18 - 2016.07.22 | ඉන්දියාව | කේ.එම් මුදිත චමින්ද මයා (සහකාර කොමසාරිස්) |
| 07 | Management of rural financing Institutions and co)operatives for rural development | 2016.08.22- 2016.08.26 | ඉන්දියාව | එස්.එච් සම්පත් මයා (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 08 | Consumer Protection Organizations for developing countries seminar | 2016.08.10 - 2016.08.24 | චීනය | පී.ඒ.සරත් ආනන්ද මයා (සහකාර කොමසාරිස් වැ.බ) |
| 09 | Developing managerial decision making skills for marketing co-operatives | 2016.09.07 - 2016.09.10 | ඉන්දියාව | එන්.ඩබ්ලිව් ඩයස් මිය (නියෝජ්‍ය කොමසාරිස්) |
| 10 | Seminar on machinery industry for superintendent officials and businessmen from developing countries | 2016.11.01 - 2016.11.21 | චීනය | චන්දන ෆොන්සේකා මයා (දිස්ත්‍රික් නිලධාරි වැ.බ) |

### 1.4.3 **මහජන බැංකු ආධාර මඟින් සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන්**

| අනු අංකය | දිනය | වැඩමුළුවේ නම | සහභාගීවූවන් |
|---|---|---|---|
| 1 | 2016.03.17 / 18 | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් |
| 2 | 2016.03.29 | සමුපකාර නීතිය සහ සමුපකාර නීතිය හා බැඳි පවතින පොදු නිතිය පිළිබඳ පුහුණු වැඩමුළුව | සමුපකාර සංවර්ධන නිලධාරීන් |
| 3 | 2016.05.05, 06 /07 | අධිභාර ක්‍රියාවලිය සහ සමුපකාර ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව | සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් |
| 4 | 2016.09.08 | ගුණාත්මක රාජ්‍ය සේවයක් සඳහා වූ මානසික මෙහෙයුම | සමස්ත කාර්ය මණ්ඩලය |
| 5 | 2016.09.22 /23 | ක්ෂුද්‍ර. මූල්‍ය පනත හා විගණන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | සමස්ත කාර්ය මණ්ඩලය |
| 6 | 2016.11.08 | විගණන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | පළාත් කොමසාරිස්වරු, දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරීන් හා සමිති නියෝජිතයින් |
| 7 | 2016.11.15 | පාරිභෝගික නීති රීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (පාරිභෝගික අධිකාරිය මගින් පවත්වන ලදි) | සමස්ත කාර්ය මණ්ඩලය |
| 8 | 2016.12.27 | විගණන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් |
| 9 | 2016.12.29 | ආයතනික සමිති වල වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පුහුණු වැඩමුළුව | ආයතනික සමිති වල ගණකාධිකාරී ගිණුම් සහයක හා අභ්‍යන්තර විගණකවරුන් |

# 2 පරිච්ඡේදය

## සංවර්ධන ක්‍රියාකාරකම්

### 2.1 2016 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම.

2016 වර්ෂය තුළ සමුපකාර සමිති කිහිපයක් ලියාපදිංචි කර ඇත.

| | සමිති/සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සංවර්ධන සමුපකාර සමිතිය | සමු 46 | 2016.02.08 |
| 02 | සී/ස ශ්‍රී.ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය | සමු 48 | 2016.07.02 |
| 03 | සී/ස ජාතික පුහුණු වෘත්තීයවේදීන්ගේ සමුපකාර සමිතිය | සමු 51 | 2016.09.28 |

### 2.2 සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

| | සමිතියේ / සංගමයේ නම | අතුරු ව්‍යවස්ථා සංශෝධන අනුමත කල දිනය |
|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | 2016.02.03 |
| 02 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | 2016.03.24 |
| 03 | සී/ස වරාය අධිකාරියේ සේවක සුභසාධක සමුපකාර සමිතිය | 2016.03.31 |
| 04 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.30 |
| 05 | සී/ස ශ්‍රී.ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 2016.07.07 |
| 06 | සී/ස ලංකා වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | 2016.08.01 |
| 07 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීමේ හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.08.31 |
| 08 | සී/ස සමෘද්ධි සංවර්ධන සහ කෘෂිකර්ම පර්යේෂන සහකාර නිලධාරීන්ගේ සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.09.21 |
| 09 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | 2016.10.28 |
| 10 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | 2016.11.17 |
| 11 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම්කම හා ඉතිරිකිරීමේ සහ ණයදෙන සමිතිය | 2016.12.01 |
| 12 | සී/ස ශ්‍රී.ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායිය සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.12.28 |

## 2.3 **සමුපකාර සමිති/ සංගම් නිලවරණ පැවැත්වීම**

| | සමිතියේ / සංගමයේ නම | නිලවරණය පැවැත්වූ දිනය |
|---|---|---|
| 01 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණයදෙන සමිතිය | 2016.05.14 |
| 02 | සී/ස ශ්‍රී.ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 2016.07.23 |
| 03 | සී/ස ලංගම සේවක ස.ණ.ස | 2016.09.08 |
| 04 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.11.05 |
| 05 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 2016.12.04 |
| 06 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | 2016.12.20 |

## 2.4 **අක්‍රිය සමිති ඈවර කිරීම**

❖ ලියාපදිංචිය අවලංගු කළ සමිති

1. සි/ස ලේඛකයින්ගේ සමුපකාර සමිතිය
2. සි/ස ශ්‍රී ලංකා කළමනාකරණ උපදේශන සේවා සමුපකාර සමිතිය
3. සි/ස ශ්‍රී ලංකා කලා නිර්මාණ ශිල්පි සමිතිය
4. සි/ස ශ්‍රී ලංකා විගණක සේවා සමුපකාර සමිතිය
5. සි/ස සමස්ත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන හා ඉතිරිකිරීමේ කටයුතු පිළිබඳ සමුපකාර සමිතිය
6. සමස්ත ලංකා අබුඩාවේ යාත්‍රාබදුකරුවන්ගේ ධීවර සමුපකාර සමිතිය
7. සි/ස සමසත ලංකා තාක්ෂණික සමුපකාර සමිතිය
8. සි/ස ශ්‍රී ලංකා ආරක්ෂක සේවයේ සුභසාධක හා ණයගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය
9. සි/ස ශ්‍රී ලංකා වෘත්තිය පත්‍රකලාවේදින්ගේ සුභසාධක සමුපකාර සමිතිය
10. සි/ස ශ්‍රී ලංකා සමුපකාර ඉංජිනේරු ආයතනය

❖ **ලියාපදිංචිය අවලංගු කිරීමට නියමිත සමිති**

1. සි/ස ශ්‍රී ලංකා ආයතනික සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර මහා සංගමය
2. සි/ස ශ්‍රී ලංකා ජනකලා භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය
3. සි/ස ශ්‍රී ලංකා වරාය සේවා සැපයුම් සමුපකාර සමිතිය


❖ **වාර්තා ලබාගැනිමට යොමුකර ඇති සමිති**

1. සි/ස සමස්ත ලංකා සමුපකාර කාන්තා එකමුතු සමිතිය
2. සි/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර කාන්තා මහා සංගමය

## 2.5 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ විගණන අංශය විසින් 2011 සිට 2016 දක්වා සැලසුම් කරන ලද හා කාර්යාලය වෙත ලද විගණන වාර්තා පිලිබඳ තොරතුරු පහත සඳහන් පරිදී වේ.

| වර්ෂය | සැලසුම් කළ විගණන | නිම කළ විගණන | වර්ෂය තුළ නිම කළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2011 | 66 | 64 | 97% |
| 2012 | 83 | 63 | 76% |
| 2013 | 74 | 61 | 82% |
| 2014 | 68 | 44 | 64.7% |
| 2015 | 80 | 11 | 13.75% |
| 2016 | 102 | 37 | 36.27% |




## 2.6 නීති කටයුතු

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදී සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- ❖ සමුපකාර සමිති වලට සම්බන්ධ නිති රිති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහය ලබාදීම

- ❖ ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම

- ❖ සමුපකාර පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/ සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම , ප්‍රදානයන් ලබාදීම ,අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම

- ❖ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි , අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

### 2.6.1 ආරවුල් බේරුම්කරණය

1992 අංක 11 හා 1983 අංක 32 දරන සංශෝධන පනත් මගින් කියවෙන 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති වලින් බේරුම්කරණය සඳහා 2016 වසර තුළ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගොනු වල සාරාංශය පහත පරිදී වේ.

| විස්තරය | එකතුව |
|---|---|
| 2016.01.01 දිනට බේරුම්කරු වෙත යොමු කිරීමට පවතින ගොනු සංඛ්‍යාව | 480 |
| 2016 වර්ෂයේ බේරුම්කරණය සඳහා ලද ගොනු සංඛ්‍යාව | 28 |
| 2016 වර්ෂයේ ආරවුල් බේරුම්කරණය සඳහා යොමු කිරීම | 222 |
| 2016.12.31 දිනට බේරුම්කරණය සඳහා යොමු කිරීමට ඇති සංඛ්‍යාව | 286 |
| 2016 වර්ෂය තුළ තීන්දු ලබා දී ඇති ගොනු | 118 |

### 2.6.2 උසාවි බලගැන්වීම

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබාදීමෙන් පසු අදාළ මුදල් අය නොවන්නේ නම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල දඩ මුදලක් සේ අය කර ගැනීමට අදාළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාළ සමුපකාර සමිති වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

| | |
|---|---|
| 2016.01.01 දිනට උසාවි බල ගැන්වීමට ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 881 |
| 2016 වර්ෂය තුළ උසාවි බල ගැන්වීමට ලද ඉල්ලීම් සංඛ්‍යාව | 147 |
| 2016.12.31 දිනට උසාවි බලගැන්වීමට ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 315 |
| 2016 වර්ෂය තුළදී උසාවි බල ගැන්වීම් සංඛ්‍යාව | 713 |

### 2.6.3 වර්ෂය තුළ අවසන් වූ නඩු

| **නඩු අංකය** | **පාර්ශවකාර සමිතිය** |
|---|---|
| DSP/48/16 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ණය දෙන සමුපකාර සමිතිය |

## 2.7 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(1) (ආ) වගන්තිය සහ 57(3) වගන්තිය යටතේ පිහිටු-වන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදි ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර , එම අරමුදලේ දායක මුදල් අය කර ගැනීම මෙන්ම වියදම් දැරීම , ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

### 2.7.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දිප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

### 2.7.2 සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44( I )සිට 44 ( iii ) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

## 2.8 2016 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම

**පුනරාවර්තන වියදම්**

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය/අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2016.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 25,000,000.00 | 23,713,535.66 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 775,000.00 | 543,208.80 |
| 1003 | වෙනත් දීමනා | 23,077,000.00 | 22,727,839.02 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 2,000,000.00 | 1,996,685.75 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 700,000.00 | 624,776.40 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,100,000.00 | 1,098,696.45 |
| 1202 | ඉන්ධන | 1,680,000.00 | 1,005,897.50 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 66,500.00 | 52,000.00 |
| 1301 | වාහන | 1,915,500.00 | 1,415,871.42 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 600,000.00 | 599,215.58 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 1,000,000.00 | 992,441.03 |
| 1403 | විදුලිය හා ජලය | 3,173,000.00 | 2,919,345.24 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 650,000.00 | 571,227.13 |
| 1405 | වෙනත් | 2,000,000.00 | 1,963,608.63 |
| 1505 | වෙනත් සම්මාදම් සහ දායක මුදල් | 383,500.00 | 383,236.48 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 600,000.00 | 520,458.81 |
| | **එකතුව** | **6,4720,500.00** | **6,112,8043.90** |

## මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය/අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2016.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | 80,500.00 |
| 2003 | වාහන | 400,000.00 | 400,000.00 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 300,000.00 | 297,502.27 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 334,000.00 | 332,850.00 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 359,500.00 | 359,291.66 |
| 2502-1 | මුදල් රෙගුලාසි (ග්‍රාමීය බැංකු නියාමනය) | 4,606,000.00 | 4,605,216.51 |
| 2502-2 | සමුපකාර ප්‍රචාරණය - සමුපදීපනී පුවත්පත මුද්‍රණය | 4,719,100.00 | 4,719,045.00 |
| 2502-3 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු කර්මාන්ත අංශය | 640,900.00 | 383,418.70 |
| | **එකතුව** | **11,459,500.00** | **11,177,824.14** |

**වියදම් එකතුව**

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2016.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 64,720,500.00 | 61,128,043.90 |
| 02 | මූලධන වියදම් එකතුව | 11,459,500.00 | 11,177,824.14 |
| | **මුළු එකතුව** | **76,180,000.00** | **72,305,868.04** |

## 2.9 ග්‍රාමීය බැංකු නියාමනය

| ක්‍රියාකාරකම් | මිනුම් ඒකකය | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | ලඟාකර ගැනීම |
| දත්ත සහ තොරතුරු රැස් කිරීම (මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තාව වැනි) | වාර්තා සංඛ්‍යාව | 32 | 12 |
| ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම | පරීක්ෂණ සංඛ්‍යාව | 04 | - |
| ග්‍රාමීය බැංකු මෙහෙයුම් අත්පොත හා වෙනත් හඳුන්වාදීම් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්විම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 30 | 19 |
| පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ සමිති සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 03 | - |
| සමුපකාර බැංකු නියාමන ජාතික කමිටු රැස්විම පැවැත්වීම | රැස්විම් සංඛ්‍යාව | 05 | 03 |

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

❖ **යුද්ධයෙන් හානියට පත් වූ සමුපකාර සමිති නඟා සිටුවීම.**

යුද්ධයෙන් හානියට පත්වූ සමුපකාර සමිති නඟා සිටුවීමේ අරමුණින් සී/ස චාවකච්චේරි විවිධ සේවා සමුපකාර සමිතියේ සහ සි/ස අලවෙඩ්ඩි මල්කාමම් විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය අංශයන්හි ගිණුම්කරණ ක්‍රියාවලිය පරිගණක ගත කිරීම සඳහා උතුරු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මුදල් ලබාදෙන ලදී.

## ❖ තරුණ තරුණියන් අතර ස්වයං රැකියා ප්‍රචලිත කිරීම

මන්නාරම් දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් යුද්ධයෙන් ආබාධයට ලක් වූ තරුණ තරුණියන් හට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මුදල් ද වෘත්තීය පුහුණුව ලත් තරුණ තරුණියන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට ණය ලබා දීමද මෙම වසර තුළදී සිදු විය. තරුණ ප්‍රජාව සඳහා ස්වයං රැකියා පුහුණුව ලබාදීමට ගොවිපොලක් ආරම්භ කිරීමට රුපියල් මිලියන 02 ක් ආයොජනය කිරීමටත් සී/ස මන්නාරම් දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිති සංගමය වෙත රුපියල් මිලියන 10 ක මුදලක් ලබාදීමත් සිදු විය.

## ❖ ජාත්‍යන්තර සමුපකාර දින උළෙල පැවැත්විම.

2016 වසරේදී 94 වැනි ජාත්‍යන්තර සමුපකාර දින උත්සවය කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැ-වති එම උත්සවය සඳහා කර්මාන්ත හා වානිජ කටයුතු අමත්‍ය රිෂාඩ් බදියුදීන් , රාජ්‍ය අමාත්‍ය චම්පික ප්‍රේමදාස, මධ්‍යම පළාත් මහ ඇමති සරත් ඒකනායක, නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු, එවකට කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යංශ ලේකම් ටී.එම්.කේ.බී තෙන්නකෝන්, සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (රේඛීය) ඩී .ජීවනාදන් , ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපති ලලිත් ඒ පීරිස් ඇතුළු සමුපකාර නායකයන් සහ තවත් විශාල පිරිසක් සහභාගී විය.

ජාත්‍යන්තර සමුපකාර දිනයට සමගාමීව මෙම වසරෙහි ජුනි 26 වන දින ජාතික සමුපකාර මණ්ඩලයේ මෙහෙයවීම යටතේ සමුපකාර හා ළමා සුරක්ෂිතතාව නමින් ද ජුනි 27 වන දින ග්‍රාමීය බැංකු මහා සංගමයේ මෙහෙයවීම යටතේ සමුපකාරය සහ පරිසරය නමින් ද, ජුනි 28 වන දින සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවක සණස සමිතියේ මෙහෙයවීම යටතේ සමුපකාර හා සෞඛ්‍ය නමින් ද ,ජුනි 29 වන දින සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමිතිය මෙහෙයවීම යටතේ සමුපකාරය සහ කාන්තාව නමින් ද, ජුනි 30වන දින ජාතික සමුපකාර ආයතනයේ මෙහෙයවීම යටතේ අධ්‍යාපනය, සාමාජික ප්‍රවර්ධන හා සක්‍රිය සාමාජික සබඳතාවය නමින් ද ,ජුලි 01 වන දින සණස මහා සංගමය මෙහෙයවීම යටතේ සමුපකාරය සහ තිරසාර සංවර්ධනය නමින් ද වැඩසටහන් රැසක් සිදු කරන ලදී.

## 2.11 සැලසුම් කටයුතු

### සංඛ්‍යා ලේඛන වාර්තාව

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිති/සංගම් හා පළාත් දෙපාර්තමේන්තු යටතේ පවතින සමිති/සංගම් වල තොරතුරු ඒකරාශි කොට ඒවා ඒකාබද්ධ කර සංඛ්‍යා ලේඛන වාර්තාව සකස් කරනු ලබන අතර මෙම වාර්තාව සමුපකාරිකයින්ට මෙන්ම ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකේය ප්‍රජාවට වැදගත් වේ.

### ක්‍රියාකාරී සැලැස්ම

2016 වර්ෂයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය සැලසුම් ගත කිරීම හා කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනිමින් වර්ෂ ආරම්භයේදී සියළු අංශයන්හි කාර්යභාරය ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී

## 2.12 මාධ්‍ය කටයුතු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රමුඛතම කාර්ය වන්නේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව රටේ ජනතාවට තොරතුරු බෙදාදීමයි.

### සමුපදීපනී පුවත්පත

ඒ සඳහා 2006 වසරේ සිට සමුපදීපනී පුවත්පත් අතිරේකය නිකුත් කිරීමෙන් එම කාර්ය ඉටුකරනු ලබයි.සෑම මසකම අවසන් සිකුරාදා දින සමුපදීපනී සිංහල මාධ්‍ය අතිරේකය පිටු 08 කින් යුතුව දිනමිණ පුවත්පත සමඟ ද දෙමළ මාධ්‍ය අතිරේකය එක් පිටුවකින් යුතුව තිනකරන් පුවත්පත සමඟ ද එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධ වී ප්‍රකාශයට පත්කරනු ලබයි. රට වටා ඇති සමුපකාර සමිති වලින් සාර්ථක සමිති පිළිබඳව සවිස්තර වාර්තා ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය සිට විකාශය දක්වා වාර්තා පළ කිරීම,ලෝක සමුපකාර ව්‍යාපාරය පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම වැනි දෑ සමුපදීපනී පුවත්පතේ පළ කරයි.

### සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙබ් අඩවිය

ලොව පුරා වෙසෙන සෑම පුද්ගලයෙකුටම මෙම දෙපාර්තමේන්තුව සහ එමඟින් සිදු වන සේවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව වෙබ් අඩවිය හරහා ලැබී ඇත. සමුපකාරික තොරතුරු ලබා ගැනීමට ඇති මාධ්‍ය පරාසය මෙමඟින් වඩාත් පුළුල් වී ඇත. තාක්ෂණික දියුණුව ඉහළ තලයක ඇති වර්තමාන ලොව තුළ සමුපකාරය ද ඉහළින් ඔසවා තැබීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුලින් මහගු දායකත්වයක් ලැබී ඇත.

# 3 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම් හී කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මඟ පෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබා දෙන ලදී.

### 3.1 වර්ෂය තුල ක්‍රියාත්මක වු සමුපකාර සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී 1227 | 1952.02.02 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.0726 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සී 2504 | 1973.03.01 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 |
| 06 | සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණයගණුදෙනු සමුපකාර සමිති මහා සංගමය | සී 2651 | 1980.11.10 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 |
| 08 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | සී 2689 | 1986.01.01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 |
| 10 | සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 |
| 11 | සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය | සමු 29 | 2003.10.07 |
| 12 | සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ මහා සංගමය | සමු 30 | 2005.11.21 |
| 13 | සී/ස ආරෝග්‍ය ශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | සමු 33 | 2007.02.23 |

### 3.2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමෙන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දිප ව්‍යාප්ත ප්‍රථමික සමුපකාර සමිති 39 ක් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යප්ත මුල්‍ය සේවා සමුපකාර සමිති
- දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

### 3.2.1 **දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති**

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබද සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන් ,

1. සාමාජික ඉතුරුම් රාශීකරණය
2. සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
3. සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
4. ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා )

**දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති - 2016**

| | සමිතියේ/සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | සි 473 | 1928.03.15 |
| 02 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සි 503 | 1928.12.07 |
| 03 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | සි 736 | 1930.11.01 |
| 04 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සි 744 | 1930.11.10 |
| 05 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණයගණදෙනු පිළිබඳ සමිතිය | සි 290 | 1938.03.30 |
| 06 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරික්ෂවරුන්ගේ සකසුරුවම්කම ණය ගණුදෙනු සහ සුභසාධක සමුපකාර සමිතිය | සී 303 | 1938.04.28 |
| 07 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | සි 255 | 1939.10.20 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභ සාධක සමුපකාර සමිතිය | සි 1046 | 1943.11.23 |
| 09 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | සි 1649 | 1949.03.29 |
| 10 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සි 1707 | 1950.08.30 |

| | | | |
|---|---|---|---|
| 11 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2233 | 1959.11.19 |
| 12 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කේ.ජී. 299 | 1960.05.26 |
| 13 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සී 2266 | 1962.02.10 |
| 14 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සී 326 | 1962.02.10 |
| 15 | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙන සමිතිය | සී 2294 | 1963.01.26 |
| 16 | සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ ණයදෙන සමුපකාර සමිතිය | සී 2357 | 1962.10.26 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගනු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2383 | 1967.10.01 |
| 18 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2402 | 1968.08.29 |
| 19 | සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සී 931 | 1973.07.25 |
| 20 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | සමු 02 | 1989.12.20 |
| 21 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයක සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය | සමු 10 | 1994.02.09 |
| 22 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 18 | 1998.04.06 |
| 23 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | සමු 22 | 2000.06.26 |
| 24 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 25 | 2001.05.05 |
| 25 | සී/ස ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 31 | 2006.01.03 |
| 26 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 32 | 2006.11.29 |
| 27 | සී/ස ප්‍රජා ශක්ති තරුණ අභිවෘද්ධි සමුපකාර සමිතිය | සමු 43 | 2014.10.02 |
| 28 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ඉතිරිකිරීමේ හා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 44 | 2014.08.12 |

### 3.2.2 **දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති**

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති හා දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිති වල මූලික කාර්යයන් ,

- සාමාජිකයින්ගේ නිෂ්පාදන මිලදී ගැනීම
- නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම
- සාමාජිකයන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම
- සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | සී 2280 | 1962.08.10 |
| 02 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලෑටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | සී 2409 | 1969.11.28 |
| 03 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | සමු 03 | 1990.03.07 |
| 04 | සී/ස සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය | සමු 07 | 1992.01.29 |
| 05 | සී/ස වතුසේවා නිලධාරීගේ නිවාස සමුපකාර සමිතිය | සමු 28 | 2003.07.11 |
| 06 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැපයුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | සමු 34 | 2007.03.07 |
| 07 | සී/ස සමස්ත ලංකා කෘෂිකාර්මික සමිතිය | සමු 41 | 2010.01.05 |
| 08 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | සමු 36 | 2011.07.07 |
| 09 | සී/ස නිවාස හා දේපල සංවර්ධන ස.ණ.ස | සමු 39 | 2011.07.07 |
| 10 | සී/ස රජරට විශ්ව විද්‍යාලය සමුපකාර සමිතිය | සමු 40 | 2011.08.28 |
| 11 | සී/ස කිරි නිෂ්පාදකයින්ගේ ජාතික සමුපකාර සමිතිය | සමු 45 | 2014.10.02 |

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**
**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**


දුරː 0112-478374, 0112-478375 ෆැක්ස් : 0112-478386

වෙබ් : www.coop.gov.lk ඊ-මේල්ː dcoopdev@sltnet.lk